| | | |
|---|---|---|
| | සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල | |
| | සැකසුම:-ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය | |
| 8 ශ්‍රේණිය -සිංහල | දෙවන වාරය | තුන්වන සතිය |

## 07 විධි ක්‍රියා හා ආශිර්වාද ක්‍රියා

❖ යම් අයෙකුට සුබ හෝ අසුබ පැතුමක් කිරීමේ දී භාවිත කරන ක්‍රියා ආශිර්වාද ක්‍රියා ලෙස හඳුන්වයි.

උදාහරණ:-සුබ පැතුම් අර්ථය:-1. නිරෝගි සම්පත් ලැබේවා.

2. සුබ වෙසක් මංගල්‍යයක් වේවා.

අසුබ පැතුම් අර්ථය:- 1. විරුද්ධවාදියෝ භංග වේවා.

2. රෝග බිය ඇති වේවා.

❖ බොහෝ විට ක්‍රියා රූපය අගට වා නිපාතය යෙදී ආශිර්වාද ක්‍රියා සෑදේ.මේවා පුරුෂ තුනෙහි ම අනතීත කාලයේ ඒක වචන බහු වචන ලෙස වර නැගේ.

උදාහරණ:-වෙම්වා--වෙමුවා /වෙහිවා--වෙහුවා /වේවා--වෙත්වා

❖ ඇතැම් විට විධි ක්‍රියා පද ද ආශිර්වාදාර්ථයේ යෙදෙන අතර වා නිපාතය නැතිවද ආශිර්වාදාර්ථයේ යෙදේ.

උදාහරණ:-හෙණ වැදියන් ,ලිස්සා වැටියන් , සැරද(සැරදේවා) , දින(දිනේවා)

ක්‍රියාකරකම්:- 1. පෙළ පොතේ 57 පිටුවේ ඇති ලිඛිත අභ්‍යාස 1 හි සඳහන් පද්‍ය පාඨවල ආශිර්වාද ක්‍රියා පද සහිත පද්‍ය පාඨ පමණක් තෝරා ලියන්න.

2. පෙළ පොතේ පිටු අංක 58 හි ඇති ලිඛිත අභ්‍යාස 3 හි සඳහන් පාඨවලට සුදුසු ආශිරාද ක්‍රියා පද යොදා හිස්තැන් පුරවන්න.